**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව - 2023**

**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 ව්‍යාවනය කළ මතය

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 ව්‍යාවනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාවනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ ව්‍යාවනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති පරිදි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සෑකසෙන වටිනාකම් හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය. ඒ අනුව මෙම ඉඩම් වල සාධාරණ අගය ගිණුම් මඟින් පිළිඹිබු නොවන අතර නිවැරදිතාවය සහ ඉඩම්වල සමස්ත වටිනාකම පිළිබඳ විගණනයට තහවුරු කර ගත නොහැකි විය. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍යඅ ගිණුම් ප්‍රමිත අංක 19 හි 141 (අ) වගන්තිය ප්‍රකාරව ආයු ගණක ප්‍රතිලාභ සහ අලාභ හඳුනා ගැනීම සඳහා වූ අස්ථිත්වයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරිමේදි ඇතුලත් කිරීමට සටහන් කර ගන්නා ලදී. | ආයු ගණක ප්‍රතිලාභ සහ අලාභ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති අනුව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ ප්‍රාග්ධන සංචිත ශේෂය රු.2,501,671,968 ක් හා රඳවාගත් ඉපැයුම් ශේෂය රු.2,750,521,503 ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එය රු. 2,501,332,952 ක් හා රු. 2,116,741,865 ක් වූයෙන් රු.339,952 ක් හා රු.633,779,638 ක ලෙස එකතුව රු.634,118,654 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2024 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට එකඟ වේ. | හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ ප්‍රාග්ධන සංචිත ශේෂය හා රඳවාගත් ඉපැයුම් ශේෂයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ශේෂයන් හා එකගවිය යුතුය. |
| (ආ) | ඉඩම් විකුණුම්, කුඹුරු ඉඩම් විකුණුම් සහ ඉඩම් අත්පත් ආදායම් වලින් සියයට 40 ක වටිනාකම වූ රු.214,115,687 ක් ප්‍රාග්ධන සංචිත ගිණුමට බැර කර තිබුණ ද එම වටිනාකම රඳවාගත් ඉපැයුම් ගිණුමෙන් අඩු කර නොතිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට එකඟ වේ. | ප්‍රාග්ධන සංචිත ගිණුමට බැර කල වටිනාකම රඳවාගත් ඉපැයුම් ගිණුමෙන් අඩු කර දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉඩම් ලේඛණයට අනුව බදුදී ඇති ඉඩම් හෙක්ටයාර් 4,833 ක් ඇතුළත්ව මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 156,838 ක් වුවත් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල හෙක්ටයාර් 2,144 ක් (අක්කර 868 පර්චස් 6.9 ක් වූ ඉඩම් කැබලි 29) පමණක් තක්සේරු කර එහි වටිනාකම ලෙස රු.905,285,000 ක් මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර තිබුණි.එය ප්‍රතිශතයක් ලෙස සියයට 1.37 ක් විය. මේ අනුව ඉඩම්වල සාධාරණ අගය ගිණුම් මගින් පිලිඹිබු නොවන අතර නිවැරදිතාවය සහ එම ඉඩම් වල සමස්ත වටිනාකම පිළිබඳ විගණනයට තහවුරු කර ගත නොහැකි විය. | තක්සේරු කිරීම සඳහා ඉඩම් මැණුම් කර පිඹුරු ලබාදිය යුතු වුවත් සියලු ඉඩම් එසේ මැණුම් කර නැත. මැණුම් කරන ලද බදු ඉඩම් තක්සේරු කිරීම සඳහා යොමුකර ඇත. 2023.12.31 දිනට බදු ඉඩම් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලැබී ඇති තක්සේරු වටිනාකම් පමණක් ගිණුම් මගින් ඉදිරිපත් කර ඇති අතර එම තක්සේරු වටිනාකම් ලැබෙන ආකාරය අනුව ගිණුම්වල ඇතුලත් කිරීමට සිදු වේ.ඉඩම් ලේඛණය තුල ප්‍රකාශ කරන ලද ඉඩම් සහ එහි ප්‍රමාණය, බැහැර කරන ලද ඉඩම් ප්‍රමාණය සහ ඉතිරි ඉඩම් පිළිබඳ තොරතුරු ඇතුලත් කොට ඇත. එම ඉතිරි ඉඩම් පිහිටි ප්‍රදේශ පිළිබඳ තොරතුරු දැනගැනීම සඳහා ගූගල් ඛණ්ඩාංක තොරතුරු ද එම ලේඛණයේ ඇතුලත් කර ඇත. | පනත අනුව අත්පත් කර ගත් ඉඩම් ඇතුළත් කර සකස් කල ඉඩම් ලේඛනයේ සඳහන් ඉඩම්වල සාධාරණ අගය ගිණුම් මගින් පිලිඹිබු විය යුතුය. |
| (ඈ) | ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ප්‍රකාරව,වතු සමාගම්වලින් සහ පුද්ගලයන්ගෙන් පවරාගත් ඉඩම් ලිපිගොනු 1,010 ක් සඳහා ගෙවිය යුතු වන්දි මුදලේ රු.215,622,362 ක් වූ ශේෂය (අදියර - I සහ II) අවිනිශ්චිත ගිණුමකට බැර කර තිබූ අතර ඒ පිළිබඳ විස්තර නොවූ අතර එය අධි හෝ ඌණ වෙන් කිරීමක් විය හැකි බව නිරීක්ෂණය විය. | මෙම වන්දි අවිනිශ්චිත ගිණුම් තුල ඇති ශේෂයන් නිරවුල් කල හැකි වන්නේ අදාල සමාගම් හා පුද්ගලයින් විසින් එම ඉඩම්වලට අදාල ඔවුන්ගේ හිමිකම තහවුරු කරගැනීමෙන් අනතුරුව පමණක් බැවින් එසේ හිමිකම තහවුරු කරන ලද පුද්ගලයින්ගේ පමණක් සමාලෝචිත වර්ෂය තුලදී හිමිකම් නිරවුල් කිරීමට කටයුතු කර ඇත. | පුද්ගලයන්ගෙන් පවරාගත් ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි නිවැරදිව ගිණුම්ගත කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | මොනරාගල, රත්නපුර, පුත්තලම සහ ගාල්ල යන දිස්ත්‍රික් කාර්යාල ගොඩනැගිලි පිහිටි ඉඩම් සහ ලිදුල බංගලා ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ වටිනාකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දේපළ, පිරියත හා උපකරණ වල දක්වා නොතිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කිරීමට අධ්‍යක්ෂ මුදල් වෙත උපදෙස් ලබා දී ඇත. | ගොඩනැගිලි හා ඉඩම් දේපළ, පිරියත හා උපකරණ වල නිවැරදි කිරීම් කළ යුතුය. |
| (ඊ) | දෙල්තොට ප්‍රාදේශීය ලේකම් නිල නිවස සඳහා අත්පත් කරගත් ඉඩමේ වන්දි ලෙස කොමිෂන් සභාවට රු. 4,742,500 ක මුදලක් 2021 අප්‍රේල් 08 දින ලැබී ඇතත් එම වටිනාකම, ලැබිය යුතු ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම ඉඩමට අදාල වන්දි මුදල දෙල්තොට ප්‍රාදේශීය ලේකම්ගෙන් ලැබි බැංකු ගත කර දිස්ත්‍රික් කාර්යාලය මගින් 2021.04.08 දින මෙම රිසිට් පත නිකුත් කර තිබේ. නමුත් මෙම ඉඩමට ලැබි තිබූ වන්දි මුදල ලැබිය යුතු වන්දි මුදලක් ලෙස ඉදිරිපත් කිරීම එම වර්ෂයේ සිට සිදුවී ඇති වැරැද්දකින් බව හඳුනාගෙන 2024 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී මුදල් අංශය හා අත්පත් හා වන්දි අංශය වෙත උපදෙස් ලබා දී ඇත. | ආදායම හා ණයගැතියන් නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | ලිට්ල් වැලිවත්ත ඉඩමේ හෙක්ටයාර් 8.974 ක් අත්පත් කරගැනීම වෙනුවෙන් දෙල්තොට ප්‍රාදේශීය ලේකම් විසින් වන්දි ලෙස රු.18,786,000 ක් 2023 ඔක්තෝබර් 11 දින කොමිෂන් සභාවට ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂයේ එම වටිනාකම ලැබිය යුතු ශේෂයක් ලෙසද ගිණුම්ගත කර තිබුණි. | මෙම වරද 2024 ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට මුදල් අංශය වෙත උපදෙස් ලබාදී ඇත. | ආදායම හා ණයගැතියන් නිවැරදි කළ යුතුය. |
| (ඌ) | වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කැඩැස්තර සිතියම් අංක 620142 කලාප 02 කැබලි අංක 13 හි අක්කර 01 රූඩ් 03 ක කොමිෂන් සභාව සතු ඉඩම අත්පත් කර ගැනීම වෙනුවෙන් ලැබිය යුතු වන්දි පොලී මුදල වූ රු. 2,214,397 කින් 2023 වර්ෂයේදී ලැබුණු වන්දි පොලිය රු. 702,999 ක් ගිණුම් ගතකර ඇතත් තවදුරටත් ලැබිය යුතු වන්දි පොලිය වූ රු.1,511,398 ක් මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනා ගෙන නොතිබුණි. | වැලිගෙපොල පොලිස් ස්ථානයට ඉඩම් අත්කරගැනීමට අදාලව ගණනය කර ඇති වන්දි පොළී මුදල රු.2,214,397 ක් වේ. එකී වන්දි පොලී මුදලෙන් රු.703,000 ක මුදලක් 2023.01.09 දින ගෙවා ඇතත් ඉතිරි ලැබිය යුතු වන්දි පොලී මුදල වන රු.1,511,398 ක මුදල සඳහා සමාජ ආරක්ෂණ බද්ද හා එකතු කල අගය මත බදු මුදල අනුව අය විය යුතු මුළු මුදල රු.2,610,221 ක් ලෙසත්, ඒ අනුව අය විය යුතු ඉතිරි මුදල රු.1,907,221 මුදලක් බව වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් වෙත 2023.03.08 දින ලිපියකින් දන්වා තිබේ. ඒ අනුව අතිරේකව ගණනය කරන ලද රු.395,823 ක මුදල සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් විසින් සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයෙහි ලේකම් දැනුවත් කර ඇති අතර මේ දක්වා එකී වන්දි මුදල ගෙවීම සම්බන්ධයෙන් අප ආයතනය දැනුවත් කර නොමැත.මෙම වරද 2024 ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට අදාළ අංශ වෙත උපදෙස් ලබාදී ඇත. | ආදායම හා ණයගැතියන් නිවැරදිව ගණනය කළ යුතුය. |
| (එ) | වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුල්ගල්කැලේ වත්ත නමැති ඉඩමේ මු.පි.නු 3362 දරන පිඹුරේ කැබලි අංක 02 හි හෙක්ටයාර් 0.4121 ඉඩම අත්පත් කරගැනීම වෙනුවෙන් වන්දි මුදල වූ රු. 18,900,000 ක් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ලැබිය යුතු වන්දි ලෙස හඳුනා ගෙන තිබුණද අමතර වන්දි මුදල වූ රු.15,557,500 ආදායම් හා ණයගැතියන් ලෙස හඳුනාගෙන නොතිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන වලින් නිවැරදි කිරිමට අදාළ අංශ වෙත උපදෙස් ලබාදී ඇත. | ආදායම හා ණයගැතියන් නිවැරදිව හඳුනා ගත යුතුය. |
| (ඒ) | මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුමාර වත්ත ඉඩමෙහි හෙක්ටයාර් 0.3582 ක් ප්‍රාදේශීය | 2024 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට අදාළ අංශ වෙත උපදෙස් ලබාදී ඇත. | ආදායම හා ණයගැතියන් නිවැරදිව ගණනය |

| | | | |
|---|---|---|---|
| | මිනින්දෝරු කාර්යාලය සඳහා අත්පත් කර ගැනීම වෙනුවෙන් ලද රු.4,954,000 ක වන්දි මුදල 2021 නොවැම්බර් 01 දින ලැබී එම වර්ෂයේ ගිණුම් ගතකර ඇතත්, ණයගැතියන්ගෙන් එම ශේෂය ඉවත් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ණයගැතියන් එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි. | | කළ යුතුය. |
| (ඔ) | 2023 ජනවාරි 01 දිනට ලැබිය යුතු මුළු තක්සේරු මත සේවා ගාස්තු ආදායම වූ රු.5,374,478 ක් අදාළ වර්ෂ වල ආදායම ලෙස හඳුනා නොගෙන සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ප්‍රවර්තන වර්ෂයේ ලාභය එම වටිනාකමෙන් අධි තක්සේරු වී තිබුණි. | මෙම ලැබිය යුතු තක්සේරු හා සේවා ගාස්තුව පෙර වර්ෂවලට අදාල වුවත් වැරදිමකින් සමාලෝචිත වර්ෂයේ ආදායමට ඇතුලත් වී ඇත. | පෙර වර්ෂ ගැළපීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඕ) | කළුගල් බදු ලෙජරය අනුව බදුකරුවන් 75 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බදුකරුවන් 20 දෙනෙකුට අදාළ වාර්ෂික බදුකුලි ආදායම් ලෙස රු.10,458,366 ක් පමණක් උපචිත පදනම මත හඳුනාගෙන ඇතත්, ඉතිරි බදුකරුවන් 55 කට අදාළ උපචිත වාර්ෂික බදු ආදායම ගණනය කර මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත කර නොතිබුණි. | කළුගල් බදු දීම්වලට අදාලව විධිමත් ක්‍රමවේදයක් නොතිබූ බැවින් වරින් වර විවිධ ක්‍රමවේදයන්ට අනුව බදුකරුවන් දැනුවත් කර බදු අයකරගෙන තිබුණි. 2022.12.31 දින වන විට වරින් වර ලබාගත් කොමිෂන් තීරණ පදනම්ව කඩා ඉවත්කර ගත් සහ ඉදිරියට කැඩීමට ඇති කියුබ් ප්‍රමාණය පදනම්ව ආදායම් අංශය විසින් 2022.12.31 දිනට බදුකරුවන් 17 දෙනෙකුට අදාලව ලෙජර් සකස්කර තිබුණි. මෙම ක්‍රමය තුලද ඉදිරියට කැඩීමට ඇති කියුබ් ප්‍රමාණයට අදාලව එනම් කඩා ඉවත්කර නොගත් කියුබ් ප්‍රමාණයන් පදනම්ව බදු අයකිරීම තුල බදුකරුවන් අපහසුතාවයට පත්වන බවට ලැබුණු ඉල්ලීම්ද පදනම්ව 2023.09.15 දිනැති කොමිෂන් සභාව පත්‍රිකාව අනුව ඉහත තීරණ ප්‍රකාරව සියළුම කළුගල් බදුකරුවන්ට අදාලව 2023.05.31 දක්වා කඩා ඉවත්කරන ලද කළුගල් කියුබ් ප්‍රමාණය පිළිබඳ තොරතුරු භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යයංශය මඟින් ඉල්ලීම් කරන ලදි. ඒ අනුව බදු ලෙජරය සකස් කරන අවස්ථාව වන විට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යයංශය මඟින් බදුකරුවන් 20 දෙනෙකුට අදාල තොරතුරු ලැබී තිබූ බැවින් එම තොරතුරු පදනම්ව බදු ලෙජරය සකස්කර ඇත. | කළුගල් බදු දීම්වලට අදාලව වාර්ෂික බදු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ක) | ලැබිය යුතු ඉඩම් විකුණුම් ආදායමින් කොමිෂන් සභාවට රු.7,863,205 ක මුදලක් ලැබී තිබුණද ලැබිය යුතු ඉඩම් විකුණුම් ආදායමින් අඩු කර නොතිබුණි. | 2024 ගිණුම් ප්‍රකාශනවල නිවැරදි කිරීමට අදාල අංශ වෙත උපදෙස් දෙන ලදී. | ලැබී ඇති ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ග) | කොමිෂන් සභාව විසින් පොල් වගා කිරීමේ මණ්ඩලය වෙත බදු පදනම මත ලබාදී ඇති කුරුණෑගල දිස්ත්‍රික්කයේ සෙරපීස් වත්ත නැමති ඉඩමට අදාළ වාර්ෂික තක්සේරුව වූ රු.960,000 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.760,000 ක් ලෙස හඳුනාගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ බදුකුලී ආදායම හා ණයගැතියන් රු.200,000 කින් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි. | 2024 වර්ෂයේ ගිණුම් වල නිවැරදි කිරීමට අදාළ අංශ වෙත උපදෙස් ලබාදෙන ලදි. | වාර්ෂික බදු ආදායම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ච) | කොමිෂන් සභාව විසින් පොල් වගා කිරීමේ මණ්ඩලය වෙත ගිවිසුම් නොමැතිව බදු පදනම මත ලබා දුන් ඉඩම් අක්කර 1,539 රූඩ් 02 පර්චස් 38.81 ක් වෙනුවෙන් අයවිය යුතු හිඟ බදු ආදායම ලෙස රු.354,658,614 ක් හඳුනාගෙන ඇතත් ඉතිරි ඉඩම් ප්‍රමාණය වන අක්කර 1,588 පර්චස් 11 කට අදාළව අයකර ගත යුතු බදු මුදල කොපමණද යන්න හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් දිවයිනේ දිස්ත්‍රික්ක 10ක් ආවරණය වන පරිදි අපගේ වාර්තා වලට අනුව අක්කර 3,139 රූඩ් 1 පර්චස් 16.11 ක් බදු පදනම මත ලබාදී ඇත. තවද විකිණීමේ පදනමෙන් අක්කර 21 රූඩ් 3 පර්චස් 39.23 ක්ද ගැසට් මඟින් අක්කර 32 ක්ද සහ අත්පත් මඟින් අක්කර 936 රූඩ් 0 පර්චස් 11.45 ක ප්‍රමාණයක්ද ලබාදී ඇත.මේ ඉඩම් මැණුමකින් තොරව 1979 – 1980 වර්ෂවල පොල් වගා කිරීමේ මණ්ඩලය වෙත භාර දී මැණුම් කටයුතු සිදුකිරීම සඳහා සහ තක්සේරු වාර්තා ලබාගැනීමට කාලයක් ගතවීම හේතුවෙන් බදු මුදල් දන්වා යැවීමට කාලයක් ගත වී ඇත. පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් ඉතා සුළු මුදලක් බදු වශයෙන් ගෙවා ඇත. භාණ්ඩාගාරය මඟින් ලබාදෙන ප්‍රතිපාදන යටතේ නඩත්තුවන බවත් විශාල මුදලක් බදු වශයෙන් ගෙවීමට හැකියාවක් නොමැති බව සඳහන් කර ඇත.<br>පාසිකුඩා වත්ත ඉඩමට අදාලව බදු අයනොවීම සම්බන්ධයෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, ඉඩම් හා සංචාරක අමාත්‍යාංශය, පොල් වගාකිරීමේ මණ්ඩලය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව නියෝජනය කරමින් කමිටුවක් පත්කර ඇත. එම කමිටුව පළමු වරට 2024.05.21 දින සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම්තුමාගේ | හඳුනා නොගත් බදු කුලී ආදායම හඳුනා ගෙන ගිණුම්ගත කිරීමටත් හිඟ බදු අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රධානත්වයෙන් රැස්වූ අතර එහිදී තීරණය කරන ලද්දේ අමාත්‍යාංශවල හා ආයතන වල ප්‍රධානීන් රැස්වී මේ සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගතයුතු බවයි.<br>ඒ අනුව 2024.07.05 දිනැතිව කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් සහ සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් ප්‍රධානත්වයෙන් කැඳ වූ සාකච්ඡාවේ දී වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් විසින් පොල් වගාකිරීමේ මණ්ඩලය වෙත හිඟ බදු මුදල් ගෙවීමට හා ඉදිරියේදි බදු නියමානුකූල කරගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙස දැනුම් දී ඇත. | |
| (ජ) | පොල් වගා කිරීමේ මණ්ඩලය වෙත බදු දීම වෙනුවෙන් අයවිය යුතු පරිහරණ ගාස්තු ලෙස රු.31,688,608 ක් හඳුනාගෙන තිබුණද ලැබිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගෙන නොතිබුණි. | 2024 වර්ෂයේ ගිණුම් ප්‍රකාශන පිළියෙළ කිරීමේදී නිවැරදි කිරීමට අදාළ අංශ වෙත උපදෙස් ලබා දී ඇත. | පරිහරණ ගාස්තු නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළයුතුය. |
| (ට) | බදුල්ල දිස්ත්‍රික්කයේ කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි තල්පිටිය වත්ත නමැති ඉඩමේ අක්කර 04 ක තිරුවානා ගල, සහිත ඉඩමට අදාළ හිඟ බදු මුදල වූ රු.5,250,480 ක මුදල අය වී නොතිබියදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කර තිබුණි. | කොමිෂන් සභාව සතු ඛනිජ ඉඩම් බදු පදනම මත බැහැර කිරීමේදි විශේෂයෙන් මිනිරන් සහ තිරුවානා ඛනිජයන්ට අදාලව ඛනිජ පමණක් නොව ඉඩමට අදාලවද බදු මුදල් අයකර ගත යුතුව ඇත. ඒ අනුව මෙම ඉඩම් කොටසට 2012 වසරට අදාලව ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත වාර්ෂික බදු මුදල රු.453,600 ක් වන අතර එම මුදල වසර 5න් 5ට සංශෝධනයට යටත්ව 2023.09.13 දක්වා ලැබිය යුතු මුදල රු.5,250,480 ක් වන අතර මෙම මුදලට අදාලව නිවැරදිව ලෙජරයේ සටහන් කර ගොනුකර තිබුණද මුද්‍රණය කරන ලද බදු ලෙජරයට ඇතුලත් කිරීමට නොහැකි වීම තුල මෙම වරද සිදු වී ඇත. එය දැනට නිවැරදිකර ඇති අතර මෙම බදුකරු මියගොස් තිබූ නිසාවෙන් මෙම ඉඩම් කොටස ඔහුගේ පුතා වෙත පවරා දෙන ලෙස කරන ලද ඉල්ලීම පදනම්ව 2024.06.12 දින පාර්ශවයන් ප්‍රධාන කාර්යාලයට කැඳවා සාකච්ඡා කල අතර එහිදි බදු මුදලෙන් සියයට 50 ක් එකවර ගෙවීමටත් ඉතිරිය වාරික වශයෙන් ගෙවීමටත් එකඟ වී ඇත. ඒ අනුව | බදු ලෙජර් නිවැරදිව පිළියෙල කිරීම හා හිඟ බදු විධිමතු අනුමැතියකින් තොරව මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් නොකල යුතුය. |

| | | |
|---|---|---|
| | ඉදිරියේදී හිඟ බදු අයකරගැනීමට අදාල කටයුතු සිදුකරන බව දන්වා සිටිමි. | |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉඩම් අමාත්‍යාංශය, ජනතා වතු සංවර්ධන මණ්ඩලය,ශ්‍රී ලංකා වැවිලි සංස්ථාවට අදාළව ලැබිය යුතු ශේෂවල එකතුව රු.2,072,166,351 ක් වුවද එම ආයතන වලින් කොමිෂන් සභාවට ගෙවිය යුතු ශේෂයක් නොමැති බව දන්වා තිබුණද එම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. ලැබිය යුතු බදු ශේෂ 36 ක් සඳහා රු.777,136,104 ක් සහ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂ 15 කට අදාළ රු.6,305,291ක ශේෂ සඳහා සනාතන ලිපි වලින් තහවුරු නොවූ බැවින් නිවැරදිතාවය විගණනයට තහවුරු නොවීය. | මුදල් අංශයට අදාල ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම් වලට අදාල ශේෂ සනාථන ලිපි 24 ක් යවා ඇති අතර ඉන් ලිපි 07කට අදාල ශේෂ සනාථන ලිපි ලැබී ඇති බව වාර්තා කර ඇත. | වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් වලට අදාළ ශේෂ සනාථන ලබා ගත යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතුව රු.4,002,737,774 ක් වූ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂයෙහි ඇතුළත් රාජ්‍ය ආයතන 03 කින් ලැබිය යුතු වර්ෂ 30 ඉක්ම වූ රු.2,126,952,139 ක් සහ වර්ෂ 10 ඉක්ම වූ රු.381,076,216 ක් සඳහා කිසිදු වෙන්කිරීමක්ද කර නොතිබුණු අතර අයවීම අවිනිශ්චිත තත්වයේ විය. | ණයගැතියන් සම්බන්ධව 2024.05.30 දින කොමිෂන් සභාවේදී පැවති අදාළ අමාත්‍යාංශ අතිරේක ලේකම්තුමන්ලාගේ නියෝජිතයින්ගෙන් සැදුම්ලත් කමිටුවේදී ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් **ලැබිය යුතු** රු.2,068,913,697 ක් ඔවුන්ගේ ගිණුම් වල ඉ.ප්‍ර.කො. සභාව නමින් ණයගැති ශේෂයක් නොමැති බව දන්වා ඇති බැවින් විගණන හා කළමනාකරණ කමිටුවට යොමු කර සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට නිර්දේශ කරන ලදී. එසේම මැතිවරණ කොට්ඨාශ සමුපාකාර සමිතියෙන් ලැබිය යුතු රු.5,073,663 ක මුදල සමුපාකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වී අදාළ පළාත් සමුපාකාර සංවර්ධන දෙපාර්තමේන්තු වල පවතින ගොණු පරික්ෂා කර බලා තොරතුරක් ලබා ගැනීමට දැනුවත් කරන ලදී.එසේම හදබිම අධිකාරියෙන් ලැබිය යුතු රු.54,911,756 ක ශේෂය මේ වන විට ඉඩම් පැවරීම් අංශයෙන් | රාජ්‍ය ආයතන සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ට දන්වා මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අයකරමින් පවතින බැවින් එම ආකාරයට ඉදිරියට කරගෙන යන ලෙස දැනුම් දෙන ලදී. ඉඩම් අමාත්‍යාංශයෙන් රු.3,252,654 ක මුදල සම්බන්ධව මු.රෙ.104 සහ 105 අනුව පරීක්ෂණයක් පවත්වා සුදුසු ක්‍රියාමාර්ගයත් ගැනීමට නිර්දේශ කරන ලදී.<br>විවිධ සේවා සමුපාකාර සමිති වලින් ලැබිය යුතුරු.3,126,686 ක මුදල එම සමුපාකාර සමිති අයත් ඉඩම් සම්බන්ධ තොරතුරු ලබා ගෙන ඉදිරිපත් කිරීම සඳහා අප ආයතනයේ ඉඩම් පැවරීම් අංශය වෙත යොමු කරන ලදී. සමුපාකාර සමිති සමඟ පැවති සාකච්ඡා අනුව සමුපාකාර සමිති 03 කින් මේ වන විට ලැබී ඇති මුදල රු. 189,451 කි. | |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන වල විවිධ ණයගැතියන් යටතේ කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්ක දෙකෙහි පිහිටි ඉඩම් කැබලි 08 ක් බදුගත් පුද්ගලයින්ගෙන් අයවිය යුතු රු.2,311,017 ක් වර්ෂ 24 කට වැඩි කාලයක සිට හිඟව පැවතුණද,අදාළ බදු මුදල් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂය තුළ ඇති ණයගැතියන් 07 දෙනා අතුරින් 06දෙනෙකු වරින්වර ගන්නා ලද කොමිෂන් තීරණ මත පදනම්ව මුදල් අයකර ඔප්පු ලබා දීමද සිදු කර ඇත .මෙම තත්ත්වය පිළිබඳව කොමිෂන් සභාවට 2024.07.02දිනැතිව පත්‍රිකා අංක 12788 දරණ පත්‍රිකාව ඉදිරිපත් කරන ලද අතර එහිදී තීරණය වූයේ ආයතනික විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කොට එහි නිරීක්ෂණ සමඟ නැවත කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙසයි. | හිඟ බදු මුදල් අයකරගැනීම ට කටයුතු කළ යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.11,322,992 ක් වූ ඉඩම් විකුණුම් අත්තිකාරම් ශේෂයෙහි වර්ෂ 10 කට වැඩි කාලයක සිට පවත්වාගෙන එන එකතුව රු.11,202,992 ක ශේෂ හා එකතුව රු.14,080,850 ක් වූ ඉඩම් බදුකුලී අත්තිකාරම් ගිණුම් ශේෂයේ ඇතුළත් පුද්ගලයින් 269 දෙනෙකුගෙන් ලබාගත් රු.11,215,850 ක අත්තිකාරම් මුදල් වර්ෂ 18 කට වැඩි කාලයක සිට රඳවාගෙන තිබුණ ද, අදාළ ඉඩම් නීත්‍යානුකූලව විකිණීමට, බදු දීමට හෝ අත්තිකාරම් නැවත පියවීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි. | ගිණුම්ගත වී ඇති මෙම ඉඩම් විකුණුම් අත්තිකාරම් වැඩි වශයෙන් 2002-2004 කාලය තුළ සිදුකරන ලද ඉඩම් ගණුදෙනු සම්බන්ධයෙනි. මේ වන විටත් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇති අතර එම අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද පසුව මෙකී නිරවුල් නොවූ අත්තිකාරම් ගනුදෙනු නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.එම කාලය තුළ පවරන ලද ඉඩම් 219 ක අක්. 11,942 කට අදාළ ඉඩම් ප්‍රමාණයකින් දැනට සරුසාරව වගා කර ඇති ඉඩම් අක්. 1,156 ක් පරික්ෂා කර කරුණු තහවුරු කරගෙන 2022.02.17 දිනැති අංක 11738 කොමිෂන් තීරණය මගින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම සඳහා කෙටුම්පත් කරන ලද කැබිනට් පත්‍රිකාව 2022.04.20 දින ඉඩම් අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. | විකුණුම් අත්තිකාරම් හා ඉඩම් බදු අත්තිකාරම් පියවීම පිළිබඳ අවධානය යොමු කල යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 44(ඕ) වගන්තිය | කොමිෂන් සභාව විසින් සේවයෙහි යොදවා ගෙන සිටින තැනැත්තන් සඳහා අර්ථ සාධක අරමුදලක් පිහිටුවීම හා සුභසාධන හා විනෝද ක්‍රීඩා පහසුකම් සහ නිවාස හා නේවාසිකාගාර හා වෙනත් ඉඩකඩ සැපයීම සිදුකල යුතුය යන්න පදනම්ව කොමිෂන් සභාවේ වසර 5 ක අඛණ්ඩ සේවයක් හිමි සේවකයෙකු හට පර්චස් එකක් රු.1,000 ක වටිනාකමට පර්.20 බැගින් ලබා දීම කර තිබුණි.ඒ අනුව 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා නිලධාරීන් 396 ක් වෙත ඉඩම් අක්කර 49 පර්චස් 35.64 ක් ලබා දී තිබුණි. | ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 44 (ඕ) වගන්තිය ප්‍රකාරව 1982-1984 කාල වකවානු වලදී ද සේවක පදනම මත ඉඩම් කොටස් ලබාදීම සිදුකර ඇත. 2005 වර්ෂයෙන් පසුව ප්‍රතිපත්තිමය තීරණය පරිදි ප්‍රදේශය කුමක් වුවත් ලබාදෙනුයේ සමාන ඉඩම් ප්‍රමාණයකි. ඉඩම් කොටස් ලබා ගැනීම සඳහා මූලික සුදුසුකම ලෙස සැලකෙනුයේ කොමිෂන් සභාවේ අඛණ්ඩව සේවා කාලය වසර 05 ක සතුටුදායක සේවා කාලයක් හා විනය විරෝධී කටයුත්තකට භාජනය නොවූ අයකු වීම වේ. 2020.09.16 පැවති කොමිෂන් සභා වාර අවස්ථාවේදී සේවා කාලය වසර 05 ක් සම්පූර්ණ කරනු ලබන කාර්ය මණ්ඩලය ඉඩම් කොටස් ලබා ගැනීමට අදාලව පොරොත්තු ලේඛනයක් මත සිදු කරන ලෙසට උපදෙස් ලබාදී ඇත. | පනතේ අර්ථ නියමානුකූලව අර්ථකතනය කර ගනිමින් ක්‍රියාකළ යුතුය. |
| (ආ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 හා 16 වන වගන්ති | කොමිෂන් සභාව විසින් 2021 වර්ෂයේ ආරම්භ කරන ලද කාබනික පොහොර ව්‍යාපෘතියට බඳවාගත් සේවකයින්ගේ සේවක අර්ථසාධක අරමුදලට හෝ සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු රු.367,625 ක මුදලක් එම අරමුදල්වලට බැර නොකර කොමිෂන් සභාවේ 2023 මූල්‍ය ප්‍රකාශනයේ ගෙවිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි. | රු.367,625 ක මුදල කාබනික පොහොර ව්‍යාපෘතියට අදාලව 2022 වර්ෂයේ ජනවාරි සිට ජූලි මස දක්වා වන සේවක අර්ථසාධක අරමුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් දායකය වේ. අදාල වාර්තා නැවත සකස් කර සති 2ක් ඇතුලත මෙම අරමුදල්වලට දායක වන සේවකයින් හඳුනාගෙන ඔවුන් නමින් අර්ථසාධක හා සේවක භාරකාර අරමුදලට ප්‍රේෂණය කරනු ලැබේ. | සේවක අර්ථසාධක අරමුදලට හෝ සේවක භාරකාර අරමුදලට අදාළ මුදල් ගෙවිය යුතුය. |
| (ඇ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ආයතනයේ ඇති අතිරික්ත මුදල්, ප්‍රති මිලදී ගැනුම් වල ආයෝජන,භාණ්ඩාගාර | 2023 වර්ෂය සඳහා කෙටිකාලීනව රාජ්‍ය බැංකුවල කර ඇති ආයෝජන සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට අදාලව සංචාරක හා | ආයෝජන සඳහා විධිමත් අනුමැතියක් ලබා ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | බිල්පත්, ස්ථාවර තැන්පතු හෝ වෙනත් ඕනෑම ආයෝජනයක් සිදු කළ හැකි වුවත් 2023 වර්ෂයේ සිදු කළ රු.2,540,580,496 ක් වූ ආයෝජන සඳහා එවැනි අනුමැතියක් ගෙන නොතිබුණි. | ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් මඟින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමුකරන ලද ලිපි සඳහා මේ දක්වා කිසිදු පිළිතුරක් ලැබී නොමැත. | |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 1645 (අ) | කොමිෂන් සභාව සතු වාහන 12 ක වාහන ලොග් පොත් නිසියාකාරව යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. | කොමිෂන් සභා වාහන සංචිතය සතුව වාහන 15 ක් ඇති අතර ඉන් ලොග් පොත් 03 ක් සම්පූර්ණ කර ඇත. විගණිත දිනය වන විට අනෙක් ලොග් පොත් 12 හි තොරතුරු මසක් ඇතුළත යාවත්කාලීන කිරීමට කටයුතු කර කරන ලෙසට කළමනාකරණ හා මානව සම්පත් සංවර්ධන අංශය වෙත උපදෙස් ලබා දී ඇත. | වාහන ලොග් පොත් නිසියාකාරව යාවත්කාලීන කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 1.1 ඡේදය | ආයතන සංග්‍රහට පටහැනිව 2020 ඔක්තෝම්බර් 23 දින සිට 2022 මාර්තු 31 දින දක්වා කොමිෂන් සභාවේ ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරේ සේවය කරමින් සිටියදී, 2021 ජනවාරි 01 දින සිට මග නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගමේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුර සඳහා වසරක පරිවාස කාලයකට යටත්ව ස්ථිර පදනම මත සේවයට බැඳී එකම කාලය තුළ ආයතන 02 න්ම වැටුප් හා දීමනා ලබාගෙන තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව විසින් අදාළ නිලධාරියාගේ පැමිණීම සහ ලබාදෙන සේවය පිළිබඳව සැලකිලිමත් නොවී වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණු රු.2,038,979 ක මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් අයකර ගෙන නොතිබුණි. | කොමිෂන් සභාව විසින් ව්‍යාපෘති අධ්‍යක්ෂ ලබා ගන්නා ලද මුදල සම්බන්ධව 2023.06.23 වන දිනැතිව නීතිපතිතුමා වෙත සියලු තොරතුරු ඇතුළත් ලිපියක් යොමු කරන ලදී. තවද, එයට පිළිතුරු නොලැබූ හෙයින් නැවත 2024.01.10 හා 2024.04.22 දිනැතිව ද ලිපි යොමු කරන ලදී. තවද, මේ පිළිබඳව ශ්‍රී ලංකා නීතිඥ සංගමය 2024.05.08 දිනැතිව ලිපියක් යොමු කරමින් රාජ්‍ය ආයතන දෙකක් හා සම්බන්ධ ගැටළුවක් වන බැවින් රාජ්‍ය ආයතනන්හි පවතින විනය ක්‍රියාමාර්ග ඔස්සේ සුදුසු පියවර ගැනීම යෝග්‍ය බව දන්වා ඇත.ඔහුට එරෙහිව නීත්‍යානුකූල කටයුතු කිරීම සඳහා ඉදිරි පියවර ගැනීමට නියමිතය. | වැඩිපුර ගෙවා ඇති වැටුප් සහ දීමනා ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | අංක 22/විවිධ (063) හා 2022 නොවැම්බර් 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය | ඉඩම් බැහැර කිරීමට අදාළ වන සියලුම කටයුතු වහාම ක්‍රියාත්මක වන පරිදි තාවකාලිකව අත්හිටුවීමට ජනාධිපතිතුමා විසින් නියම | අංක PS/PSB/AS-02/LAND/2023 සහ 2023.05.25 දින දරණ ලිපියෙන් කොමිෂන් සභාව විසින් බැහැර කරනු ලබන ඉඩම් වහාම නවත්වන ලෙසත්, | ඉඩම් බැහැර කිරීම විධිමත් අනුමැතියකට අනුව කළ යුතුය. |

| | | |
|---|---|---|
| හා ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ 2023 මැයි 25 දිනැති අංක PS/PSB/AS-02/LAND/2023 දරන ලිපිය | කර තිබුණද එම ලිපියේ නියමයන් අභිබවා 2023 මැයි 25 දිනෙන් පසුව ඉඩම් අක්කර 714 රූඩ් 5 පර්චර් 8.57 ක් බැහැර කර තිබුණි. | ඉඩම් බැහැර කිරීම් සම්බන්ධයෙන් යම්කිසි කාර්යයක් ඉටු කරන්නේ නම් ජනාධිපති කාර්යාලය දැනුවත් කරන ලෙසය. ඒ අනුව කොමිෂන් සභාව විසින් ඉඩම් බැහැර කරනු ලබන අවස්ථාවන් සම්බන්ධයෙන් 2023.06.02 සහ 2023.06.22 යන දිනයන්හිදී ජනාධිපති ලේකම් කාර්යාලයෙන් උපදෙස් ඉල්ලා ඇතත් ඒ සම්බන්ධයෙන් උපදේශයක් ලැබී නොමැත. ඉඩම් අමාත්‍යතුමාගේ ලිපිය අනුව ව්‍යවස්ථාපිත බැඳීම් සහ කොමිෂන් සභාව සතු ඉඩම්වල පදිංචිව සහ භුක්තියේ සිටින තැනැත්තන් නියමානුකූල කිරීමට උපදෙස් මත සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ඉඩම්) විසින් සභාපතිතුමා වෙත යොමුකර ඇති ලිපිය පරිදි කොමිෂන් සභාව සතු ඉඩම්වල පදිංචියේ සහ භුක්තිවිඳින තැනැත්තන් වෙත ඔප්පු ලබාදීමට පියවර ගන්නා ලෙසට උපදෙස් ලබා දී ඇත.කරුණු එසේ වුවත් ඉහත සඳහන් 2023.05.25 දිනැති ලිපිය කොමිෂන් සභාව වෙත ලැබුණු දිනට පෙර කොමිෂන් සභාව විසින් නියමිත පරිදි මැනුම් කිරීම්, මුදල් අයකිරීම් සහ කොමිෂන් තීරණ ලබාදීම් සිදුකර තිබූ ඉඩම් බැහැර කිරීම් සිදුකර ඇත. මෙම කාල වකවානුව තුළ නව ඉඩම් බැහැරකිරීම සඳහා තීරණ ලබාගැනීමට කටයුතු කර නොමැත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.636,050,744 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 518,199,960 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 117,850,784 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මූල්‍ය ආදායම් රු.175,750,004 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

(අ) පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ, ඉඩම් බදුකුලී ආදායම සහ ස්ථාවර තැන්පතු පොලී ආදායම පිළිවෙලින් සියයට 9කින්, සහ සියයට 113 ක අගයන්ගෙන් වැඩිවන විට ඉඩම් අත්පත් ආදායම්,ඉඩම්

විකුණුම් ආදායම ,ඉඩම් පරිහරණ ගාස්තු ආදායම් පිළිවෙලින් සියයට 9 කින් ,30කින්  සහ සියයට 39 ක අගයන්ගෙන් අඩුවී තිබුණි.

(ආ) පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ප්‍රවාහන දීමනා සහ වාහන කුලී වියදම් පිළිවෙලින් සියයට 25 කින් සහ සියයට 89 කින් අඩු වී තිබුණද මෝටර් රථ අලුත්වැඩියා වියදම්, අතිකාල දීමනාව, සේවක පාර්තෝෂික හා ප්‍රසාද දීමනා පිළිවෙලින් සියයට 55කින්,104කින්,43 කින් සහ සියයට 56 කින් වැඩිවී තිබුණි.

**2.3 අනුපාත විශ්ලේෂණය**

(අ) සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 4 : 1 ක් වූ අතර 2022  වර්ෂයේ එම අනුපාතය 23 : 1 ක් විය. ඒ අනුව ජංගම අනුපාතය පෙර වර්ෂයට සාපේක්ෂව පහළ අගයකින්  පවත්වාගෙන ගොස් තිබුණද  කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වලට වැඩියෙන් ජංගම වත්කම් වල මුදල් ආයෝජනය කර ඇති බව නිරීක්ෂණය විය.

(ආ) 2022  වර්ෂයේ සියයට  11 ක් ව පැවති තෝලන අනුපාතය සමාලෝචිත වර්ෂයේදී සියයට 34ක් දක්වා ඉහළ ගොස්  තිබුණද, කොමිෂන් සභාව විසින් මුලු වගකීම් පියවීමට අවශ්‍ය ප්‍රමාණයට වැඩි හිමිකම් ප්‍රාග්ධනයක් පවත්වාගෙන ගොස් ඇති බව නිරීක්ෂණය විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාවේ 2021 මාර්තු 15 දිනැති පාලන චක්‍රලේඛ අංක 2021/01 හි (ඉ) වගන්තිය අනුව 2015 ජනවාරි 01 දිනෙන් පසු සියලුම නව අනවසරකරුවන් නෙරපීම කළ යුතු අතර අංක 22/විවිධ (063) හා 2022 නොවැම්බර් 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉඩම් බැහැර කිරීම නතර කරන ලෙස දන්වා තිබුණද එයට පටහැනිව නොදියුණු තක්සේරු වටිනාකම වන රු.920,000 කට බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි මුතුවාන වත්ත ඉඩමේ කැබලි අංක 01 හි අක්කර 02 පර්. 7.22 ක් වූ ඉඩමෙහි අනවසර පදිංචිකරුට විකිණීමෙන් පවරා දී තිබුණි. | මුතුවාන වත්ත ඉඩමෙ ක්ෂේත්‍රයේ නිදහස්ව පවතින සහ වර්තමානයේ භාවිතා කරන ඉඩම් කොටස් හඳුනාගැනීම සඳහා 2022.01.05 දාතමින් මැනුම් නියෝගයක් නිකුත් කර ඇත.එම ඉඩමේ හිමිකරුවෙකු වන රසල් ප්‍රනාන්දු යන අය සතුව පැවති බිම් කොටස සහ කොමිෂන් සභාව සතු ඉඩමෙහි මායිම් හඳුනාගැනීමට කටයුතු කිරීමේදී උක්ත නම් සඳහන් අය මිළදී ගෙන පැවති බිම් ප්‍රමාණය තුලට කොමිෂන් සභාව සතු මුතුවාන වත්තේ අක්කර 07 රූඩ් 2 පර්චස් 24.92 ක් ඇතුලත්ව භුක්ති විඳින බව පිඹුරු අංක 439 හා 2022.02.15 දිනැති පිඹුරුපත මඟින් හඳුනාගෙන ඇත. පෙර මැනුම් කිරීමේදී මිනින්දෝරුවරයා අතින් සිදුව ඇති වරදක් බවත් කොමිෂන් සභාව විසින් පවරා දෙනු ලබන විධිමත් ක්‍රමවේදයක් යටතේ එම බිම් ප්‍රමාණය මිළදී ගැනීමට කැමැත්ත ප්‍රකාශ කර ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. එහිදී ඉල්ලුම්කරු විසින් සංචාරක ව්‍යාපාරය කේන්ද්‍ර කොට ගනිමින් ව්‍යාපාර කාර්යයන් සිදු කරනු ලබන බවත් එම අරමුණෙන් අදාළ විෂයගත බිම් කොටස පවරා දීමට උපදෙස් විමසා කොමිෂන් පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී. රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ වර්තමානනොදියුණු තක්සේරු වටිනාකම අය කර 22 (1) ආ ආ වගන්තිය යටතේ විෂය භාර අමාත්‍යවරයාගේ | ඉඩම් බැහැර කිරීම විධිමත් ක්‍රමයකට අනුව සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අනුමැතියෙන් විකිණීමෙන් පවරා දීමට 2022.09.21 දින කොමිෂන් සභාව අනුමත කර ඇත. | |
| (ආ) | භාණ්ඩාගාර ලේකම්ගේ 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන රාජ්‍ය වියදම් පාලන චක්‍රලේඛයේ 2 වන වගන්තිය ප්‍රකාරව ගොඩනැගිලි කුලියට ගැනීම නතර කළ යුතු බව දන්වා තිබුණද කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල 07 ක් කුලී පදනම මත පවත්වා ගෙන යාම වෙනුවෙන් 2022 හා 2023 වර්ෂ වලට අදාළව බදු කුලීය ලෙස රු.49,571,072 ක් දරා තිබුණි. එසේම කොමිෂන් සභාව ආරම්භකර දැනට වසර 50 කට ආසන්න වූවත් කොමිෂන් සභාවට අයත් ගොඩනැගිලි වල කාර්යාල පිහිටුවීමට කටයුතු කිරීමට කළමනාකරණය අපොහොසත්වී ඇති බව ද තවදුරටත් නිරීක්ෂණය විය. | දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් විසින් රජයේ ගොඩනැඟිලිවල ඉඩ පහසුකම් සොයාගත නොහැකි බව වාර්තා කිරීමෙන් අනතුරුව කුලී පදනම මත පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත. කෙසේ වෙතත් දිස්ත්‍රික් කාර්යාල 03 ක් කොමිෂන් සභාව සතු ගොඩනැඟිලිවල පවතින අතර තවත් දිස්ත්‍රික් කාර්යාල 10 ක් රජයේ ගොඩනැඟිලිවල පවත්වාගෙන යනු ලබයි. | රාජ්‍ය වියදම් පාලන චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | කොමිෂන් සභාව සතුව ගාල්ල කුරුඳුගහ හැතැප්මේ පර්.31.5 ක ඉඩම සහිත ගොඩනැගිල්ලේ කොමිෂන් සභා ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය එහි පවත්වා ගෙන යාමට කටයුතු නොකර ගාල්ල නගරාසන්නයේ පිහිටි පර් 9.79 ක් වූ ගොඩනැගිල්ලක රු.65,000 ක් වූ මාසික බදු කුලියට ලබා ගෙන පවත්වා ගෙන යාම හේතුවෙන් 2018 වර්යේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා දරා තිබුණු ගොඩනැගිලි කුලීය වූ රු.4,870,000 ක් නිශ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය. | 2018 වර්ෂයේ උප කාර්යාලයක් ලෙස මෙම ස්ථානය පවත්වාගෙන ගොස් ඇති අතර, ගාල්ල නගරයේ සිට ආසන්න වශයෙන් කි. මීටර් 39 ක දුරකින් පිහිටීම හේතුවෙන් අනෙකුත් රාජකාරි කටයුතු වලද දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවන බවත් නිරීක්ෂණය විය. | පිරිවය අවම වන ආකාරයට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු හිඟ ඉඩම් බදු වටිනාකම රු. 1,180,434,743 කට අදාළ බදුකරුවන් සංඛ්‍යාව 401 ක් වන අතර ඉන් බදුකරුවන් 116 කට පමණක් බදු ගිවිසුම් ලබාදී තිබූ අතර හිඟ බදු මුදල වූ රු. 904,486,633 කට අදාළ බදුකරුවන් 285 කට නීත්‍යානුකූලව ගිවිසුමකට එළඹීමකින් තොරව ඉඩම් බදු දී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ හිඟ බදු මුදලින් අයකර ගත් වටිනාකම සියයට 13 ක් හා සමාලෝචිත වර්ෂයේ ආදායමින් අයකරගත් වටිනාකම සියයට 30 ක් වී | 2023.12.31 දිනට ලැබිය යුතු බදු මුදලට අදාළව බදුකරුවන් 403 දෙනෙක් හඳුනාගෙන ඇති අතර එම ප්‍රමාණයෙන් බදු නොගෙවා අයකර ගැනීමට නීතිමය පියවර ගත යුතු බදුකරුවන් 246 ක් වන අතර වාර්ෂික හා වාරික පදනමින් බදු අයකර ගත හැකි බදුකරුවන් ගණන 157 කි. බදු අයනොවන නීතිමය ක්‍රියාදාමය තුලින් කඩිනමින් අයකර ගත යුතු වශයෙන් තවදුරටත් වර්ගීකරණය කර ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | බදු දී ඇති ඉඩම් සඳහා නීත්‍යානුකූල ගිවිසුම් වලට එළඹීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. ඒ අනුව නීත්‍යානුකූල ගිවිසුම් නොමැතිව බදු දී ඇති නිසා හිඟ බදු මුදල් අයකර ගැනීම සඳහා නඩු මාර්ගයකට හෝ යාමට නොහැකිවී තිබුණි. | | |
| (ඉ) | ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ප්‍රකාරව පුද්ගලික සමාගමක් සතු ටෙම්පල්ස්ටෝව් වත්ත ඉඩම 1974 ජුලි 09 දින පවරාගෙන ඇතත් එම සමාගම විසින් පැවරූ නඩුවේ තීන්දුව අනුව අක්කර 439 රූඩ් 02 පර්.03 ක ප්‍රමාණයක භුක්තිය 1993 නොවැම්බර් 23 දින නැවත සමාගම වෙත භාරදී තිබුණි. සමාගමට 1974 සිට 1993 දක්වා කාලය සඳහා ඔවුන්ගේ අහිමිවූ ආදායම් සහ අහිමි වූ අලාභය සඳහා පොලිය සම්බන්ධව ගොනුකළ නඩුවට අදාළව ලබාදුන් නියෝගය ඉටු නොකිරීම නිසා 2001 වර්ෂයේදී ගෙවිය යුතු මුදල වූ මුදල රු.මිලියන 100 ක් එකී කාලයේදී නොගෙවීම හේතුවෙන් එම මුදලට වාර්ෂික පොළියද එකතුවීම නිසාවෙන් රු.මිලියන 500ක් ගෙවීමට එකඟ වී තිබුණි. ඒ අනුව රු.මිලියන 400 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට එරෙහිව පුද්ගලික සමාගම විසින් පවරන ලද නඩුව සහ තවත් ඒ හා සම්බන්ධිත නඩු 5 ක් සඳහා අලාභ වශයෙන් අලාභ මුදල් ගෙවන ලෙසට (means and profits) එකී දිසා අධිකරණය විසින් 2001.02.23 වන දින තීන්දුවක් ලබා දෙන ලදී. එහෙත් පොළිය ලබා දීමට එමගින් තීන්දු කර නොතිබුණි.<br>එබැවින් එම තීන්දුවෙන් අතෘප්තියට පත් පෙරකී නඩු වල පැමිණිලිකරුවන් අභියාචනාධිකරණය වෙත අවසන් අභියාචනයක් ඉදිරිපත් කල අතර එයට කොමිෂන් සභාව විසින් ප්‍රති අභියාචනයක් සහ ප්‍රතිශෝධන ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදී. එම සියලු ඉල්ලීම් සියල්ල එක්ව සලකා බැලූ ගරු අභියාචනාධිකරණය අලාභයට සියයට 100 ක පොළියක්ද, ඒ මත නෛතික පොළියක්ද, ගෙවීමට නියම කරන ලදී.ගරු අභියාචනාධිකරණය පෙරකී 2006.02.20 දිනැති තීන්දුවට එරෙහිව SC/SPL/LA 78/2006 දරණ අභියාචන අවසර ඉල්ලීම අප ආයතනය විසින් ඉදිරිපත් කරන ලදී. මේ පිළිබඳව දිගින් දිගටම අධිකරණයේ හා කමිටු මඟින් සිදු වූ සාකච්ඡාවලින් පසුව රු. මිලියන 208 ක් අඩුකොට රු.මිලියන 500 ක මුදලක් ගෙවීමට ඇතිකර ගන්නා ලද එකඟත්වය කැබිනට් මණ්ඩලයේ අනුමැතියට යටත්ව අංක 12515 දරණ කොමිෂන් පත්‍රිකාව මගින් 2023-12-20 වන දින රැස්වූ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව අනුමත කරන ලදී. නීතිපතිතුමාගෙන් වාර්තාවක් කැඳවීමට යටත්ව මෙම සමථය ඇතිකර ගැනීමට සුදුසු ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබාදෙන ලදී.ඒ අනුව 2024.04.24 වන දින රුපියල් මිලියන 500 ක් පැමිණිලිකරුවන්ට ගෙවන ලදී. | විධිමත් ක්‍රමවේදයකට අනුව නිරවුල් අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | කොමිෂන් සභාවේ ඒකාබද්ධ ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියක් 2019 මැයි 22 දින පුද්ගලික ආයතනයකින් රු.8,500,000 කට මිලදී ගෙන තිබුණ ද, එම තොරතුරු පද්ධතිය මගින් ලැබිය යුතු ඉඩම් බදු මුදල් පිළිබඳ තොරතුරු ලබාගැනීමට සමාලෝචිත වර්ෂයේ | MIS තොරතුරු පද්ධතියේ ප්‍රගතිය පිළිබඳ සාකච්ඡා කිරීමට Science Land Information Technology (Pvt) Ltd ආයතනය සහ තාක්ෂණික ඇගයීම් කමිටුව රැස් වූ අතර, එහිදී සාකච්ඡා වූ කරුණු සහ TOR එක අනුව හැකි ඉක්මනින් තොරතුරු පද්ධතිය මගින් ලැබිය යුතු ඉඩම් බදු මුදල් ලබා ගැනීමට හැකි ආකාරයෙන් | ඒකාබද්ධ ගිණුම්කරණ මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දෙසැම්බර් 31 දින වන විටත් නොහැකි වී තිබුණි | MIS තොරතුරු පද්ධතිය සකසන බව එකඟ වී ඇත.ඒ අනුව මේ වන විට ණයගැති ශේෂ සම්බන්ධයෙන් පද්ධතිය සකස් කරමින් පවතී. මීට අමතරව මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී. | |
| (ල) | සභාව සඳහා, පූර්ණ ඒකාබද්ධ පරිගණක පද්ධතියක් නිර්මාණය කිරීම, සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා 2002 වර්ෂයේ දී පෞද්ගලික සමාගමක් වෙත ගෙවා තිබුණු රු.17,000,000 ක මුදල නැවත ලබා ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගන්නා ලෙස 2022 පැවති පොදු ව්‍යාපාර කාරක සභාවට දන්වා ඇතත් ඒ අනුව කටයුතු කිරීමට මෙම වාර්තාවේ දින වන විටත් කටයුතු කර නොතිබුණි. | මෙම අක්‍රමිකතාවය පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. නමුත්, එහිදී මෙම අක්‍රමිකතාව සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තවදුරටත් කටයුතු නොකරන බවත්, මේ සම්බන්ධයෙන් අල්ලස් සහ දූෂණ විමර්ශන කොමිෂන් සභාව සමඟ කටයුතු කරන ලෙසත් උපදෙස් දී ඇත.ඒ අනුව, අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත පැමිණිලිකර ඇතත් ඔවුන් විසින්ද අල්ලස් පනත යටතේ අධිකරණයේදී නඩු පවරා සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමට තරම් ප්‍රමාණවත් කරුණු නොමැති බව දන්වා ඇත. මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාව මේ සම්බන්ධයෙන් තොරතුරු විගණන හා කළමනාකරණ කමිටුව වෙත ද ඉදිරිපත් කර ඇති අතර, 2015.07.07 දිනැතිව පැවති 670 වන කොමිෂන් සභා වාරයට කරුණු ඉදිරිපත් කිරීමෙන් පසු කොමිෂන් සභාව විසින් මේ සම්බන්ධයෙන් සම්පූර්ණ වාර්තාවක් ලබාගෙන, නිර්දේශ ලබා ගැනීම සඳහා ඉඩම් අමාත්‍යාංශය මඟින් මහා භාණ්ඩාගාරය වෙත 2016.06.21 දිනැතිව වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර, මේ වන තෙක් මහා භාණ්ඩාගාරය වෙතින් පිළිතුරු ලැබී නැත. 2022.10.21 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා අවස්ථාවේදී ද, පූර්ණ වාර්තාවක් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශයේ ලේකම් වෙත නියෝග ලබා දෙන ලදී. ඒ අනුව, පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීමේදී සිදුවී ඇති මූල්‍ය අක්‍රමිකතාව පිළිබඳව සියළු තොරතුරු 2023.05.18 වන දින පැවති 790 වැනි කොමිෂන් සභා වාරය වෙත ඉදිරිපත් කර ඇති අතර, මේ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් උපදෙස් ඉල්ලා 2023.08.24 දිනැතිව ලිපියක් යොමුකර ඇති අතර, මේ වන තෙක් පිළිතුරක් ලැබී නොමැත. | මුදල නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ළ) | කොමිෂන් සභාවේ ඉඩම් මැනුම් කර නියමානුකූල කරන අවස්ථාවේ කට්ටි කරුවන්ගෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට යටත්ව මිනින්දෝරුවන් හට 2019,2020 හා 2021 යන වර්ෂ වලදී ගෙවා තිබුණු | ගාල්ල දිස්ත්‍රික්කයේ විශේෂ ව්‍යාපෘතියක් ලෙස කොමිෂන් සභාවේ ලියාපදිංචිගත බලයලත් මිනින්දෝරුවන් වෙත 2019, 2020 හා 2021 යන වර්ෂවලදී කොමිෂන් සභාව විසින් මිනින්දෝරු ගාස්තු වශයෙන් ගෙවන ලද රු. | ඉඩම් කට්ටිකරුවන්ට ලබාදෙන අවස්ථාවේදී මැනුම් කර |

| | | | |
|---|---|---|---|
| | එකතුව රු.33,229,487 ක මුදලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට රු.7,616,274 ක් පමණක් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණු අතර එදිනට තවදුරටත් ලැබිය යුතු ශේෂය රු.25,613,213 වේ. | 33,229,487 ක් වූ මුදලින් 2023.12.31 දින වන විට රු. 25,613,211 ක මුදලක් අයවීමට තිබුණි. එයින් රු. 1,081,472 ක මුදලක් 2024.06.30 දින වන විට ප්‍රතිපූර්ණය කර ඇත. ඒ අනුව 2024.06.30 දින වන විට රු. 24,531,739 ක මුදලක් ප්‍රතිපූර්ණය කරගැනීමට ඇත. දැනට මැනුම් කර ඇති ඇතැම් ඉඩම් සම්බන්ධයෙන් CA(W)399/2022 යටතේ නමුණුකුල වැවිලි සමාගම විසින්ද, CA(W)161/2021 යටතේ තලවකැලේ වැවිලි සමාගම විසින්ද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වගඋත්තරකරු කරමින් පෙත්සම්කාර සමාගම් විසින් කොමිෂන් සභාවට එරෙහිව තහනම් නියෝග ලබාගෙන තිබීම, 2019 වර්ෂයේ සිට පැවති කොවිඩ් වසංගත තත්ත්වය සහ රටතුළ පැවති අයහපත් ආර්ථික තත්ත්වය තුළ කට්ටිලාභීන් මුදල් ගෙවීමට ඉදිරිපත් නොවීම යනාදී කරුණු මෙම මුදල් අයකරගැනීම ප්‍රමාද වීමට හේතු වී ඇත. කෙසේ වෙතත් කට්ටිලාභීන් වෙත මුදල් ගෙවන ලෙස දැනුම් දී මෙම මුදල් අයකරගැනීමට අධ්‍යක්ෂ ඉඩම් වෙත උපදෙස් ලබා දී ඇත. | ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (එ) | කොමිෂන් සභාවට අයත් නාවලපිටිය විල්ටන් වත්ත ඉඩමේ තේ කර්මාන්ත ශාලාව සහිත අක්කර 02 රූඩ් 01 පර්චස් 05 ක ප්‍රමාණය තිස් අවුරුදු බදු පදනම මත 1997 අගෝස්තු 30 දින සිට වාර්ෂික බදු කුලිය රු.270,000 බැගින් පුද්ගලික සමාගම වෙත බදු දී තිබුණි. 2008 වර්ෂයේදී පුද්ගලික පාර්ශවයක් විසින් ඉහත ආයතනයේ වෙළඳනාමය සමඟ ඉඩම පවරා ගෙන ඇතත් මේ සම්බන්ධයෙන් අනුමැතියක් හා ගිවිසුමකට එළඹීමකින් තොරව හෝ කිසිදු අය කිරීමකින් තොරව අවිධිමත් ලෙස භුක්තිවිඳීමට කොමිෂන් සභාව විසින් ඉඩදී තිබූ අතර 2023 දෙසැම්බර් 31 දින දක්වා වසර 26 ක කාලයක සිට අයවිය යුතු බදු මුදල රු.18,403,926 ක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | මහනුවර දිස්ත්‍රික්කයේ නාවලපිටිය පිහිටි විල්ටන් වත්ත ඉඩමේ අක්. 02 රූ. 1 පර්. 05 ක ප්‍රමාණය වසර 30 ක් සඳහා සී/ස සුපර් ඉන්ඩස්ට්‍රීස් ඇන්ඩ් එක්ස්පෝර්ට් පුද්ගලික සමාගම වෙත පවරා දී තිබුණි. ඉන්පසුව 2008 වසරේදී තිලක් කුමාර උඩුගම යන අය විසින් මෙම ඉඩම් කොටස පවරාගෙන තිබූ අතර 2022 වසර දක්වා බදු නොගෙවීම හේතුවෙන් නාවලපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 79899/18 හා 2021.03.26 දිනැති නඩු තීන්දුව ප්‍රකාරව තිලක් කුමාර උඩුගම මහතා මෙම දේපළින් නෙරපීම සඳහා නියෝගයක් නිකුත් කර ඇත. හිඟ බදු මුදල අයකරගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ නීති වෙතින් වාර්තාවක් ලබා ගැනීමට උපදෙස් දී ඇත.මෙම හිඟ මුදල් අයකර ගැනීම සඳහා නීතිපතිතුමාගේ වෘත්තීය සේවය ලබාගැනීමට අධ්‍යක්ෂ නීති විසින් 2024.01.10 දිනැතිව නීතිපතිතුමා වෙත ලිපියක් යොමු කර ඇත. | හිඟ බදු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) | ගාල්ල අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ලෙව්වම් බී වත්ත නැමැති ඉඩමෙන් අක්කර 08 ක් අවුරුදු 30 ක කාලයක් සඳහා “පදනමකට” බදු පදනම මත ලබා දී ඉඩමේ භුක්තිය ඒකපාර්ශිකව කොමිෂන් සභාව වෙත | ගාල්ල දිස්ත්‍රික්කයේ අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ලෙව්වම් බී වත්ත ඉඩමෙන් සහන ළමා සංවර්ධන පදනම වෙත අක්කර 08 ක ප්‍රමාණයක් 2005.01.01 දිනැතිව බදු පදනම මත ලබා දී ඇත. 2022.12.31 දක්වා අයවිය යුතු බදු මුදල රු.6,998,800 කි. 2005 සිට | පවරාගත් ඉඩම පනතේ අරමුණු වෙනුවෙන් යොදාගත යුතු අතර හිඟ බදු අය කර ගැනීමට ද |

| | | | |
|---|---|---|---|
| | 2021 වර්ෂයේදී පවරාගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන දින වන විට හිඟව පැවති රු.6,998,800 ක මුදල අයකර ගැනීමට කොමිෂන් සභාව මේ දක්වා කටයුතු කර නොතිබුණි. | මේ දක්වා කිසිදු බදු මුදලක් ගෙවා නොමැති අතර තක්සේරු හා සේවා ගාස්තුවට අදාලව රු.50,000 ක් 2005.08.15 දිනැතිව ගෙවා ඇත. මෙම ඉඩමේ ගොඩනැඟිලිද ඉදිකර වගා කරමින් සිටි ස්වාමින් වහන්සේ 2020.05.18 දිනඋන් වහන්සේ අපවත් වී ඇත. ඒ අනුව මෙම හිඟ බදු මුදල් සම්බන්ධ මුදල් රෙගුලාසි 101(1)(2) හා (3) ට අනුව කටයුතු කිරීම සුදුසු බවට 2022.03.02 දිනැතිව දැනුම් දී ඇත. ස්වාමීන් වහන්සේ අපවත් වීමට පෙර මෙම ඉඩමෙන් අක්. 03 ක ප්‍රමාණයක් වික්‍රමසිංහ නැමැති පුද්ගලයෙකුට පවරා ඇති අතර එම අය විසින් මෙම අක්. 03 ක ප්‍රමාණයේ අගාවුඩ් වගා කර භුක්ති විඳිමින් සිටින අතර අයවිය යුතු බදු මුදලින් සමානුපාතික මුදලක් එම අය ගෙවීමට කැමැත්ත ලබාදී ඇත. ඒ අනුව ඔහු විසින් භුක්ති විඳින කොටස බදු පදනම මත එම අය වෙත ලබාදීමටත් ඉතිරි අක්. 05 ක ප්‍රමාණයේ පිහිටි ගොඩනැගිලි සහිත ඉඩම කොමිෂන් සභාවට පවරා ගැනීමටත් ස්වාමීන් වහන්සේ අපවත් වී ඇති බැවින් උන් වහන්සේ විසින් ඉදිකර ඇති ගොඩනැගිලි තක්සේරු කර ලැබිය යුතු හිඟ බදු මුදලට හිලව් කර ගොඩනැගිලි සමගම වෙනත් සුදුසු බදුකරුවෙකුට ලබාදීමට කොමිෂන් සභාවේ උපදෙස් ලබාගැනීමට කටයුතු කරනු ලැබේ. | පියවර ගත යුතුය. |
| (ඔ) | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාහේන උතුර 615 බී ග්‍රාම නිලධාරී වසමට අයත් ඉඩමෙහි නොබෙදූ අක්කර 14 රූඩ් 1 පර්චස් 9.9 ක ඉඩම තුළ අනවසර ලෙස ස්වාමින් වහන්සේ නමක් අක්කර 5 කට ආසන්න ප්‍රමාණයක්ද, තවත් පෞද්ගලික ඉඩම් හිමිකාරියක් පර්චස් 66 ඉක්මවූ ප්‍රමාණයක්ද භුක්ති විඳින අතර 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 16 වගන්තිය ප්‍රකාරව අනවසර භුක්තිකරුවන් නෙරපා හැරීමට නීතිමය කටයුතු කර නොතිබුණි. | කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි කොමිෂන් සභාව සතු හැගල්ල වත්ත ඉඩම හඳුනා ගැනීම සඳහා අංක 15/6/3626 හා 2021.05.21 දිනැති මැනුම් නියෝගයට අනුව මැනුම් කර අංක 1581 හා 2021.07.22 දිනැති පිඹුර ඉදිරිපත් කර ඇත. එම මැනුමේදී වර්තමානයේ සුජාතා වීරකෝන් යන අය හිමිකාරිත්වය දරණ බංගලාව සහිත පර්චස් 66 ක කොටසට අමතරව කොමිෂන් සභාව සතු ඉඩමෙන් කොටසක් අනවසරයෙන් භුක්ති විඳින බව හෙළි වූ අතර එම කොටස 1581 පිඹුරේ කැබලි අංක 08 ලෙස පෙන්වා ඇත.නමුත් සුජාතා වීරකෝන් යන අය විසින් මේ වන විට CA(W)576/2021 දරණ නඩුව කොමිෂන් සභාවට විරුද්ධව ගොනු කිරීම නිසා එම අනවසර ක්‍රියාව සම්බන්ධයෙන් මෙතෙක් ක්‍රියාමාර්ගයක් ගැනීමට නොහැකි වී ඇත.ගිහිපැවිදි ප්‍රජානායක පුහුණු මධ්‍යස්ථානයක් සඳහා ඉසිපතනාරාමාධිපති පූජ්‍ය ගරු තන්ජම්තැන්නේ ධම්මරංසි හිමියන් විසින් බදු පදනම මත ලබා ගැනීමට ඉල්ලීමක් කර ඇති | අනවසර භුක්තිකරුවන් වෙනුවෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය |

| | | | |
|---|---|---|---|
| | | අතර එම ඉල්ලීමට අනුව 1581 පිඹුරෙන් අක්කර 4 රූඩ් 2 පර්චස් 00 ක නිරවුල් බිම් ප්‍රමාණයක් කොමිෂන් සභාව නමින් මැනුම් කිරීමට අංක 15/6/3626 හා 2021.11.08 දිනැති මැනුම් නියෝගය නිකුත් කරන ලදි. නමුත් සුජාතා වීරකෝන් යන අය අභියාචනා අධිකරණයේ අංක CA(W)576/2021 දරණ නඩුව කොමිෂන් සභාවට විරුද්ධව ගොනු කිරීම නිසා මැනුම් කිරීමට නොහැකි වු බැවින් බදු දීමට අදාල ඉදිරි කටයුතු සිදු වි නොමැත. | |
| (ඕ) | කොළඹ දිස්ත්‍රික්කයේ කොලොන්නාව වැල්ලම්පිටිය ප්‍රදේශයේ පිහිටි ජා කොටුව වත්ත ඉඩමෙන් රූඩ් 01 පර්චස් 9.79 ප්‍රමාණය වාර්ෂික බදු කුලිය රු.1,590,000 ක් බැගින් පුද්ගලයෙකු වෙත පවරා ඉඩමේ වෙළඳපල වටිනාකම මත එය රු.26,500,000 කට තක්සේරු කර ඇතත් බදු කුලිය ඉතා ඉහළ අගයක් බැවින් එය ගෙවිය නොහැකි බව දන්වා තිබූ අතර මේ දක්වා කිසිදු බදු මුදලක් අය වී නොතිබුණි. | 2021 වසරේදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව ලැබී ඇති අතර එම වර්ෂයට අදාල බදු මුදල රු.1,590,000 කි. මෙම මුදල ගෙවන ලෙසට 2021.07.19 දිනැතිව බදුකරු දැනුවත් කර ඇති අතර තක්සේරු වටිනාකම ඉතා ඉහල අගයක් බැවින් හා මෙම ව්‍යාපාරය තුලින් උපයන ආදායමෙන් මෙම බදු මුදල ගෙවීම කිසිසේත් සිදුකල නොහැකි බැවින් නැවත බදු සංශෝධනය කර දෙන ලෙසට ඉල්ලීම් කර ඇත. ඒ අනුව අධ්‍යක්ෂ/ තක්සේරු හා වන්දි විසින් 2022.01.07 දිනැතිව තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී තිබුනද එය වෙනස් කිරීමට නොහැකි බව තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මෙම ආයතනය දැනුවත් කර ඇති අතර ඒ පිළිබඳව අදාළ බදුකරු වෙත දැනුම්දීමෙන් පසුව ඔහු විසින් නැවතත් ඉහත තක්සේරුව පිළිගත නොහැකි බවට සඳහන් කරමින් නැවත එය තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලෙස අභියාචනයක් මෙම කොමිෂන් සභාව වෙත යොමුකර ඇති අතර ඒ පිළිබඳව නැවතත් 2023.07.04 දින තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. කෙසේ වෙතත් මේ දක්වා රජයේ තක්සේරුව ලැබි නොමැති බැවින් බදු ගිවිසුම ද ලබා දීමට නොහැකි වී ඇත. | රජයේ තක්සේරුව මත බදු අයකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ක) | ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි රාගෙදර වත්ත ඉඩමෙන් අක්කර 70 ක් මිනිරන් කැනීම සඳහා රජයේ තක්සේරු වටිනාකම මත වර්ෂ 05 ක කාලයක් සඳහා පුද්ගලික සමාගමක් වෙත 2011 වර්ෂයේදී බදු දී තිබුණි. මෙම මිනිරන් සහිත ඉඩම සඳහා 2023 දෙසැම්බර් 31 දින දක්වා ගෙවූ මුදල රු. 8,110,356 ක් රජයේ තක්සේරුව ලබාගෙන නොතිබීම මත ලැබුණු අත්තිකාරම් ලෙස ගිණුම්ගත කර තිබුණි. මෙම විගනන වාර්තාවේ දින වන විටත් වර්ෂ 12 ක් පමණ ගතවී තිබුණද තක්සේරු කර බදු ගණනය කර අයකර ගැනීමට හා දෙපාර්ශවය අතර බදු ගිවිසුමකට එළඹීමට කොමිෂන් සභාව මේ දක්වා අපොහොසත් වී තිබුණි. | ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22(1) ආ ආ වගන්තිය යටතේ රජයේ ප්‍රධාන තක්සේරු කරුගේ වර්තමාන තක්සේරුව ලබා දෙන ලෙස ඉල්ලමින් 2012.10.19 දින අධ්‍යක්ෂ/තක්සේරු හා වන්දි වෙත යොමු කර ඇතත් තක්සේරු වාර්තා ලබා දී නොමැති අතර දිස්ත්‍රික් අධ්‍යක්ෂ විසින් 2022.01.15 දින අධ්‍යක්ෂ/තක්සේරු හා වන්දි වෙත පිටපත් සහිතව අදාල ඉඩමේ තක්සේරු වටිනාකම වාර්තා කරන ලෙස අධ්‍යක්ෂ/ව්‍යාපෘති වෙත දැනුම් දි ඇත.ඒ අනුව ඉඩමට අදාලව තක්සේරුව ලබා ගැනීම සඳහා තමන් සතුව ලේඛන නොමැති බවත්, එබැවින් අදාල ලේඛන ලබා දෙන ලෙසත්, දන්වමින් අධ්‍යක්ෂ/තක්සේරු හා වන්දි විසින් 2022.06.21 දිනැති ලිපියෙන් අධ්‍යක්ෂ/ව්‍යාපෘති වෙත යොමු කර ඇත.එකී ඉල්ලීමට අනුව 2022.07.11 දිනැතිව නැවතත් තක්සේරු හා වන්දි වෙත ලේඛන යොමු කර ඇත.ඒ අනුව 2022.08.18 දින ප්‍රධාන තක්සේරුකරු වෙත යොමු කර ඇති අතර අදාල තක්සේරු වටිනාකම ලබාදෙන ලෙස අධ්‍යක්ෂ/ආදායම් විසින් 2023.03.13 දින කරන ලද විමසීමට අනුව අධ්‍යක්ෂ/තක්සේරු හා වන්දි විසින් 2023.03.29 දිනැතිව පළාත් තක්සේරුකරු වෙත සිහි කැඳවීමක් යොමුකර තිබුණද අදාල තක්සේරු වාර්තාව ලබා දීමට කටයුතු කර නොමැති බැවින් නැවතත් 2023.12.25 දිනැතිව අධ්‍යක්ෂ/තක්සේරු හා වන්දි වෙත මෙම තක්සේරු වාර්තාව ලැබීමේ ප්‍රමාදය පිළිබඳව සොයා බලා කටයුතු කරන අතර මෙම ව්‍යාපෘතිය තුලින් මේ වන විට රු.8,937,144 ක මුදල අය කරගෙන ඇත.ඒ අනුව තක්සේරු වාර්තා ලැබුනු පසු අදාල ගැලපීම් කර හිඟ බදු මුදල අයකරගෙන විධිමත් බදු ගිවිසුමක් ලබාදීමට කටයුතු කරනු ලැබේ. | රජයේ තක්සේරුව මත බදු අයකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ග) | මහනුවර දිස්ත්‍රික්කයේ අම්බලන්වත්ත ඉඩමෙන් අක්කර 25 ක් පුද්ගලික සමාගමක් වෙත සිලිකා ව්‍යාපෘතියක් සඳහා 2011 වර්ෂයේ දී බදු දී තිබූ අතර 2012 – 2015 සහ 2017 – 2019 වර්ෂවල කිසිදු බදු මුදලක් අයකරගෙන නොතිබුණි. 2023.12.31 දින වන විටත් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තා ලබාගෙන හෝ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය මගින් වාර්තා ලබාගෙන සාධාරණ ක්‍රමවේදයකට අයකළ යුතු බදු මුදල තීරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම් කොටසට අදාලව ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව ලැබෙන තෙක් වාර්ෂික දල තක්සේරුවක් මත බදු ගෙවන ලෙස 2018.01.21 දිනැතිව ආයතනය වෙත දැනුම් දී තිබුණි.ඒ අනුව ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව ලබා ගැනීම සඳහා 2011.05.03, 2020.09.14 හා 2021.01.27 යන දිනැතිව තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. 2024.04.04 දිනැතිව ලේඛකාධිකාරි භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය වෙත ද ලිපියක් යොමු කර ඇත.ඉඩමට අදාල තක්සේරුව හා සිලිකා වලට අදාල තොරතුරු ලැබෙන තෙක් තාවකාලික තක්සේරුව මත බදු අය කල යුතු බැවින් 2024.03.12 අධ්‍යක්ෂ ආදායම් විසින් බදුකරු දැනුවත් කර ඇති අතර ඒ අනුව 2024.04.03 දිනැතිව රු.2,000,000 ක මුදලක් අප වෙත ගෙවා ඇත. ඒ අනුව ලැබිය යුතු හිඟ මුදලේ ශේෂය වන රු.2,127,500 මුදල කඩිනමින් ලබා ගැනීමට කටයුතු කරන බවත් ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව ලැබුණු පසුව අදාල ගැලපීම සිදු කරන ලෙසටත් අදාල අංශ වෙත උපදෙස් ලබා දී ඇත.තව ද 2012/2015 හා 2017/2019 වර්ෂ වල බදු මුදල් නොගෙවීමට හේතුව ලෙස බිලුබෙ මිනරල් ආයතනය විසින් සඳහන් කරනුයේ එම කාල පරිච්ඡේදය තුල මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවූ බවයි. | රජයේ තක්සේරුව හෝ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය මගින් ලබාගත් වාර්තා අනුව බදු මුදල අයකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ච) | දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ගලිමුරේ වත්ත කැබලි අංක 01 හි අක්කර 12 රූඩ් 02 පර්චස් 4.48 ක ප්‍රමාණය තුළ පිහිටි කළු ගල 2011 ජූලි මස බදු දී තිබුණි. 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 12 ක් පමණ ගතවන තෙක්ම අදාළ බදුකරු නියමිත පරිදි බදු නොගෙවීම සම්බන්ධව ගතයුතු ක්‍රියාමාර්ග කොමිෂන් සභාව විසින් නොගැනීම හේතුවෙන් එමගින් උපයා ගත හැකිව තිබූ ආදායමක් අහිමිවී තිබුණි. | ගම්පහ දිස්ත්‍රික්කයේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ගලිමුරේ වත්ත නැමති ඉඩමින් අක්කර 12 රූඩ් 2 පර්චස් 4.48 ක ප්‍රමාණය වරින් වර සංශෝධිත අංක පනතේ 22 (1) අ වගන්තිය ප්‍රකාරව 2011 වසරේ රජයේ ප්‍රධාන තක්සේරු කරුගේ තක්සේරුව මත භුක්ති විදි කාලයට අදාලව පරිහරණ ගාස්තුවක්ද ඇතුලත්ව බදු දීමට 2011.07.26 දිනැති කොමිෂන් සභාවේ තීරණය ලැබී ඇත.ඒ අනුව තක්සේරුව කැඳවා බදු ගෙවන ලෙසට 2023.01.23 දිනැතිව 15/6/4028 දරණ ලිපිය මහින්ද 2023.10.24 දිනැතිව 3/5/2/1/ගම්/95 දරණ ලිපිය මහින්ද දැනුම් දී ඇත. තවද බදු මුදල් ගෙවීම පැහැර හරින්නේනම් මෙම ඉඩම් කොටසට අදාලව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අභිමතය පරිදි ඉදිරි කටයුතු සිදුකරන බවට 2023.05.29 දිනැතිව බදුකරු දැනුවත් කර ඇත. එම ලිපියට අනුව ගෙවීමකින් තොරව භුක්ති විදීමට අවසර ඉල්ලා බදුකරු විසින් 2023.08.22 දිනැතිව ඉල්ලීමක් කර ඇත.බදු නොගෙවීම හේතුවෙන් නීතිමය පියවර ගැනීමට 2023.10.17 දිනැතිව අධ්‍යක්ෂ නීති දැනුවත් කර ඇති අතර නීතිමය පියවර කඩිනමින් සිදුකරන බව අධ්‍යක්ෂ ආදායම් විසින් දන්වා ඇත. | නිවැරදි ගිවිසුමක් මත බදු අයකල යුතුය. |
| (ජ) | 2023 දෙසැම්බර් 31 දින වන විට පවතින මුළු නඩු සංඛ්‍යාව 1,123 ක් වන අතර නීති වියදම් ලෙස රු.34,657,989 ක මුදලක් දරා තිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාල නිවැරදි කිරීම් කරන ලෙස අධ්‍යක්ෂ මුදල් වෙත උපදෙස් ලබා දී ඇත. | නීති වියදම් පිළිබද නිවැරදිව සොයා බැලිය යුතුය. |
| (ට) | 2021 වර්ෂයේදී රු. මිලියන 350 ක් වැයකර ආරම්භ කල කාබනික පොහොර ව්‍යාපෘතියේ වියදමට සාපේක්ෂව උපයාගෙන තිබුණු ආදායම රු.මිලියන 22 ක් වීම මත මෙම ව්‍යාපෘතිය අසාර්ථක ව්‍යාපෘතියක් ලෙස 2022 වර්ෂයේදී අවසන් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් රු.මිලියන 31 කට වඩා අධික යන්ත්‍ර සූත්‍ර සහ කාර්යාල උපාංග ස්ථානගත කර ඇති හා එම වත්කම් වර්ග හා වටිනාකම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවිය. 2023 මාර්තු 28 දිනැති අමප/23/383/615/017 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මෙම ව්‍යාපෘතිය අසාර්ථක වීමට හේතු වී ඇති කරුණු එහි මුදල් භාවිතාකොට ඇති ආකාරය සහ ඒ සඳහා දායක වූ පාර්ශව | කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලද කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය උතුරු මැද පළාත කේන්ද්‍රකොට ගනිමින් මධ්‍යස්ථාන 35ක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29ක් තුළ පවත්වාගෙන යන ලදි.ඒ සඳහා මූලික වියදම ලෙස රු.මිලියන700ක් ඇස්තමේන්තු කර තිබූ අතර පළමුව රු. මිලියන 350ක් වෙන්කර තිබුණි.එම මුදල් උපයෝගී කරගනිමින් උක්ත ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර එය සාර්ථකව පවත්වාගෙන යන ලදි. මෙම ව්‍යාපෘති 2021.12.31 දින දක්වා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මහින් ක්‍රියාත්මක කිරීමටත් ඉන් අනතුරුව 2022.01.01 දිනෙන් පසු ඉඩම් අමාත්‍යාංශයේ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමටත් තීරණය කර තිබුණි. නිෂ්පාදිත පොහොර අලෙවි කිරීම සඳහා කොමර්ෂල් පොහොර සමාගම සමඟ ගිවිසුමක් ද අත්සන් කරන ලද අතර නිෂ්පාදිත පොහොර එම | විශේෂ විමර්ශන වාර්තාව අනුව කටයුතු කල යුතුය. |

පිළිබඳ ස්වාධීන පූර්ණ විමර්ශනයක් සිදු කිරීමට සාමාජිකයන් තුන් දෙනෙකුගෙන් යුත් විශේෂ විමර්ශන කමිටුවක් සංචාරක හා ඉඩම් අමාත්‍යාංශ ලේකම් විසින් පත්කර එම වාර්තාව 2023 අප්‍රේල් 29 දිනැති සංචාරක හා ඉඩම් අමාත්‍යාංශ ලේකම්ගේ අංක 9/2/6/17 ලිපිය මගින් සති 02 ක් තුළ ඉදිරිපත් කරන ලෙස දක්වා ඇතත් 2024 ජුනි දක්වා ඉදිරිපත් කර නොතිබුණි.

ආයතනය වෙත ලබාදීමට කටයුතු කර ඒ තුළින් රු. මිලියන 09ක මාසික ආදායමක් අපේක්ෂා කරන ලදි.ගිවිසුම් ප්‍රකාරව කොමර්ෂල් පොහොර සමාගම ද මෙම පොහොර මිලට ගැනීම අත්හිටුවන ලදි. මේ සියළු කරුණු සැළකිල්ලට ගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මගින් රජයට පාඩුවක් සිදුවන බැවින් 2022.07.14 වන දින මෙම ව්‍යාපෘතිය අවසන් කරන ලදි.කාබනික පොහොර ව්‍යාපෘතිය සඳහා මිලදී ගන්නා ලද යන්ත්‍ර සූත්‍ර සහ කාර්යාල උපකරණ සඳහා රු.මිලියන 81,150,320ක මුදලක් වැයකර තිබුණි. 2022.07.14 දිනැතිව කාබනික පොහොර ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමත් සමඟ මෙම මිලදී ගන්නා ලද යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳ තීරණ ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්තුමා විසින් කමිටුවක් පත්කරන ලද අතර කාබනික පොහොර ව්‍යාපෘතිය සඳහා මිලදී ගන්නා ලද යන්ත්‍ර සූත්‍ර සහ කාර්යාල උපකරණ රාජ්‍ය ආයතනයන්ට ලබාදීමට එම කමිටුව විසින් තීරණය කරන ලදි. ඒ අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, ඇල්ල ප්‍රාදේශීය සභාව යන රාජ්‍ය ආයතන වෙත මෙම යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මේ වනවිට ලබාදී අවසන් කර ඇත.සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත පරීක්ෂණ කමිටුව විසින් කොමිෂන් සභාව වෙතින් කාබනික ව්‍යාපෘතියට අදාළව ආරම්භ කරන ලද ලිපිගොනු හා කොමිෂන් සභා තීරණ ආදී ලේඛන ඉල්ලුම් කරන ලද අතර එම ලේඛන සියල්ල එම කමිටුව වෙත භාරදෙන ලදි. කෙසේ නමුත් අවසන් පරීක්ෂණ වාර්තාවක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුවත් වී නොමැත.

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| ශ්‍රේණිය | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය අනුව | | 2018කැබිනට් තීරණය මගින් අනුමත සංඛ්‍යාව | | කොමිෂන් පත්‍රිකාව අනුව බඳවාගෙන ඇති සේවකයින් ( කොන්ත්‍රාත් පදනම මත) | | මුළු තත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අනුමත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | අනුමැතිය ලැබූ සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | | | |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ | 5 | 4 | 11 | - | - | - | 4 | 1 | - |
| මධ්‍යම කළමනාකරණ | 33 | 30 | 9 | 3 | - | - | 33 | - | - |
| තාක්ෂණික | 6 | 3 | - | - | - | - | 3 | 3 | - |
| කනිෂ්ඨ කළමනාකරණ | 4 | 3 | 21 | - | - | - | 3 | 1 | - |
| • පුද්ගලික කර ඇති තනතුරු | 28 | 20 | - | - | - | - | 20 | - | |
| කළමනාකරණ සහකාර | 215 | 182 | 153 | 123 | 77 | 56 | 361 | - | 106 |
| • පුද්ගලික කර ඇති තනතුරු | 40 | | | | | | | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රාථමික | 61 | 39 | 20 | 22 | 13 | 8 | 75 | - | 14 |
| **එකතුව** | **392** | **281** | **214** | **148** | **90** | **64** | **499** | **5** | **120** |

- කොන්ත්‍රාත් සේවයේ නියුතු බංගලා මුරකරුවකු හා අනියම් මුරකරුවන් 5 දෙනෙකු ඇතුළත්ව ඇත.

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2018 ජුනි 27 දිනැති අංක අමප/18/1126/829/002 දරන කැබිනට් තීරණය මගින් වර්ෂයක කාලයක් සඳහා නිලධාරීන් 214 දෙනෙකු බඳවා ගැනීමට අනුමැතිය ලබා දී තිබුණු අතර කාර්ය සාධනය අනුව වසර 3ක කාලයක් සඳහා එම නිලධාරීන්ගේ සේවය දීර්ඝ කළ හැකි බව එහි දක්වා තිබුණද අදාළ වසර 3 අවසන් වීමෙන් පසුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියෙන් තොරව කළමනාකරණ සහකාර 138 ක්,රියදුරු 10ක් සහ කාර්යාල සහයක 16 ක් සඳහා ස්ථිර පත්වීම් ලබාදී තිබුණි. මීට අමතරව කොමිෂන් සභා පත්‍රිකා මගින් බඳවාගෙන ඇති කළමනාකාර සහකාර තනතුරු 56 ක් හා ප්‍රාථමික තනතුරු 08 ක් සඳහාද කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ගෙන නොතිබුණි. | 2018.06.27 දින කොමිෂන් සභාවට කළමනාකරණ සහකාර, කාර්යාල සහයක, රියදුරු හා සහකාර අධ්‍යක්ෂ (නීති) යන නිලධාරීන් 214 ක් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අනුමැතිය ලබාදී ඇත.ඉන්පසුව, 2019.09.18 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/2019 ප්‍රකාරව බලාත්මක කරන ලද 25/2014 හා 25 (2014) (1) චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව කොන්ත්‍රාත් සේවයේ නිරත නිලධාරීන් ස්ථිර කරන ලදී. මේ පිළිබඳ නිලධාරීන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් ක්‍රියාපාටිය අනුගමනය කරමින් මු.රෙ. 71 අනුව අනුමත කර ගැනීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. ඒ අනුව, අංක 2/1/12/22 හා 2022.01.20 දිනැතිව ලේකම්, ඉඩම් අමාත්‍යාංශය මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත සභාපතිතුමාගේ අත්සනින් ස්ථිර කාර්ය මණ්ඩලයට ඇතුළත් කිරීම සඳහා අනුමැතිය ඉල්ලා වාර්තාවක් ඉදිරිපත් කර ඇත. එම වාර්තාව සම්බන්ධව සාකච්ඡාවක් 2022.02.22 වන දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ දී පැවැත්විය. එම සාකච්ජාවේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ලබා දෙන ලද උපදෙස් පරිදි කාර්යය මණ්ඩලයේ පවත්නා ගැටළු පිළිබඳව 2022.05.24 දින ඉඩම් අමාත්‍යාංශය මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත වර්තාවක් යොමු කර ඇත. උක්ත සාකච්ඡාවේදී සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටිය සකස් කර ඉදිරිපත් කරන ලෙස | කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය අනුව සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් දැනුම් දුන් අතර, ඒ අනුව සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටිය ද සකස් කර ඇති අතර, 2022.10.21 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමෙන් අනතුරුව 2022.11.03 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් නැවත සාකච්ඡාවක් පැවැත්වූ අතර, එම සාකච්ඡාවේ තීරණය පරිදි එම බඳවාගත් කාර්ය මණ්ඩලය කොමිෂන් සභාවේ රාජකාරි අවශ්‍යතාවය මත ස්ථිර කාර්යය මණ්ඩලයට අනුයුක්ත කිරීම සඳහා අනුමැතිය ලබාගැනීමට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.ඒ අනුව, අමප/23/0293/615/008 හා 2023.02.06 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර ඇති අතර, 2023.04.04 දිනැතිව තීරණයක් ලබා දී ඇත. නමුත් එම තීරණය මඟින් ඇතිවී ඇති ප්‍රායෝගික ගැටළු සහගත තත්ත්වය නිරාකරණය නොවන බැවින්, නැවත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලෙස අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී ලබාදුන් උපදෙස් පරිදි අමාත්‍යතුමා සහ අමාත්‍යාංශ ලේකම් සමඟ සාකච්ඡා කර අමප/24/0689/615/013 හා 2024.06.12 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කර ඇත.එම පත්‍රිකාවට ලද තීරණයට අනුව, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ප්‍රතිව්‍යුහගතකරණයට නියමිත ආයතනයක් වන බැවින් මෙම අවස්ථාවේදී තනතුරු ඇතිකිරීම හා කාර්ය මණ්ඩලය බඳවාගැනීම සුදුසු නොවන බවද, එබැවින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 හා 25/2014 (1) යටතේ ස්ථිර කිරීමට කටයුතු කරන ලදුව පරිපාලනමය ක්‍රියාමාර්ගයක් හේතුවෙන් කාර්ය

මණ්ඩලයට ඇතුළත් කිරීමට නොහැකි වූ යම් සේවකයෙක් වේ නම්, මේ වනවිට කොමිෂන් සභාවේ පුරප්පාඩුව ඇති සමාන්තර තනතුරු සඳහා එම සේවකයින් පත්කිරීම සම්බන්ධයෙන් විරුද්ධත්වයක් නොමැති බවට ද නිර්දේශ ලබා දී ඇත.උක්ත අමාත්‍ය මණ්ඩල තීරණය 2024.07.02 දින පැවති 809 වැනි කොමිෂන් සභාවට පත්‍රිකාවක් මඟින් ඉදිරිපත් කළ අතර, එහිදී ලබාදුන් තීරණය වනුයේ අමප/24/0689/615/013 හා 2024.06.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, අනු අංක III හි රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 25/2014 හා 25/2014 (1) යටතේ ස්ථිර කිරීමට කටයුතු කරන ලද සේවකයින් අතුරින් කොමිෂන් සභාවේ පුරප්පාඩුව ඇති කළමනාකරණ සහකාර තනතුරු 77, කාර්යාල සහායක තනතුරු 18 ක් හා රියදුරු තනතුරු 05ක් සඳහා බඳවාගැනීමට ජ්‍යෙෂ්ඨත්වය පදනම් කරමින් අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා කර තෝරා ගැනීම අනුමත කරන ලදී.එම තීරණය අනුව, සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා කමිටුවක් පත්කර මේ වන විට ලිපිගොනු පරීක්ෂා කිරීමේ කටයුතු සිදුකරමින් පවතී.